ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2019
------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 07 හි දේපල පිරියත හා උපකරණ පිළිබඳ වූ ප්‍රමිතියේ 92 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එහෙත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 340,629,707 ක්වූ දේපල පිරියත හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 03 ප්‍රකාරව සංශෝධනය කර නැවත මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | අප ආයතනය 2015 වර්ෂයට පෙර මිලදීගත් ස්ථාවර වත්කම් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් ආයතනය සතු ස්ථාවර වත්කම් සියල්ල ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු සූදානම් කරමින් ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 07 හි දේපල පිරියත හා උපකරණ පිළිබඳ වූ ප්‍රමිතියේ 42 වගන්තිය ප්‍රකාරව ඉඳුරාන සරත්චන්ද්‍ර රාජකරුණා ජාත්‍යන්තර මධ්‍යස්ථානය සඳහා 2017 ජනවාරි 09 දින පරිත්‍යාගයක් වශයෙන් ලබාදී තිබුණු හෙක්ටයාර් 0.28 ක ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉඩම අගයකර දෙන මෙන් කිහිප විටක් ඉල්ලීම් කළ ද ඔවුන් විසින් මේ වන තුරුත් තක්සේරු වාර්තාව ලබා නොදෙන ලදි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රමක්ෂේපිත විලම්භිත ප්‍රදාන ආදායම(**Amortized Differed Grant Income**) රු. **3,221,352** ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අදායමක් ලෙස හඳුනා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම එම වටිනාකමින් අඩුවෙන්ද විලම්භිත ප්‍රදාන අදායම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ක්‍රමක්ෂේපිත විලම්භිත ප්‍රදාන ආදායම ගණනය කිරීමේ දී සිදුවූ වරද **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට බලාපොරොත්තුවේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉන්වොයිස් පත් දෙවරක් ගිණුම්ගත කිරීම නිසා ඇතිවූ දෝෂයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අදායම සහ බලශක්ති අරමුදල සඳහා ලැබියයුතු මුදල් රු. **1,005,550** ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ලැබිය යුතු ගිණුම් තුළ බලශක්ති අරමුදල සඳහා ලැබිය යුතු මුදල් ලෙස පෙන්වන ශේෂය **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලදී නැවත ප්‍රතිශ්ඨාපනය කොට නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | අදාල පරිදි ගැලපුම් කර නිවැරදි ශේෂයන් පවත්වා ගත යුතුය. |
| (ඇ) | වැඩ අවසන්කර තිබුණු ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියකට අදාළ උපකරණ සඳහා ගෙවාතිබුණු රු. **2,299,935** ක බදු කෙරීගෙන යන වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ කිහිපයක සිට දක්වා තිබුණද එය සමාලෝචිත වර්ෂයේදී හෝ නිවැරදි කිරීමට කටයුතුකර නොතිබුණි. | මේ පිළිබද **2020** මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු සුදානම් කර ඇත. | තොරතුරු පරික්ෂා කර නිවැරදිව අදාල වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඇ) | වෙනත් ජංගම වත්කම් යටතේ වර්ගකර ඇති වෙනත් අත්තිකාරම් ගිණුමට වැරදීමකින් රු. **301,918** ක් බැරකර තිබීම නිසා එම වටිනාකමින් අත්තිකාරම් ගිණුම් ශේෂය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | **2020** මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කිරීමට කටයුතු සුදානම් කර ඇත. | ගැලපුම් කර ලේජරයේ ශේෂයන් නිවැරදිව පවත්වා ගත යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| පුනරීන් විදුලිබල ව්‍යාපෘතියට අදාලව උපදේශන සේවා සැපයීම වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයට ගෙවනලද ගෙවීම් | **9,192,859** | වවුචර්පත් සහ උපයෝගී ලියවිලි | ගෙවීම් සඳහා ලදුපත් ඉක්මණින් අප අධිකාරියේ මූල්‍ය අංශයට ලබා දෙන ලෙස කොළඹ විශ්ව විද්‍යාලයෙන් ඉල්ලීමක් කර ඇත. | නොපමාව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේ දී පළාත් 03 ක් වෙනුවෙන් අධ්‍යාපන කලාප වැඩ සටහන් සඳහා දැනුම් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබූ රු. 3,246,466 ක අත්තිකාරම් මුදල් 2019 දෙසැම්බර් 31 දින දක්වාම පියවා ගැනීමට කටයුතුකර නොතිබුණි. | අදාල පළාත් අධ්‍යාපන කාර්යාල වෙත සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට පිටපතක් යොමු කරමින් මෙම අත්තිකාරම් මුදල් ඉක්මනින් පියවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | අත්තිකාරම් ලබාදුන් කාර්යය නිම කළ වහාම අදාල අංශය විසින් එය අධීක්ෂණය කර මුදල් පියවා නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ලැබිය යුතු අත්තිකාරම් යටතේ ඇතුලත් රු. 1,094,015 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාලයක් ඉදිරියට ගෙන එමින් පවතින අතර එම මුදල් අය කර ගැනීමට හෝ ඒ සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට හෝ පොත් සටහන් වලින් ඉවත් කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා කටයුතු යොදා ඇත. | ලබාදුන් අත්තිකාරම් පිළිබඳ සමාලෝචනය කරමින් අදාල කාර්යය නිම වූ වහාම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ගෙවීම් හා ණයහිමියන් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. **2,953,225** ක් වර්ෂ **01** සිට **04** ක කාලයක සිට ද ආපසු ගෙවිය යුතු තැන්පතු ලෙස දක්වා තිබූ රු. **277,256** ක් වර්ෂ **05** ට වැඩි කාලයක සිට ද ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර මෙම මුදල නිරවුල් කිරීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අපොහොසත්ව තිබුණි. | මෙම මුදල් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත. | ණයහිමියන් හා වෙනත් ගෙවිය යුතු ශේෂ සමාලෝචනය කරමින් ගිණුම් කාලයන් තුල පියවීමට කටයුතු කිරීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2007** අංක **35** දරන සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පනතේ **46 (3)** වගන්තිය | සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩමක් වසර **30**කට බදු ගැනීමට හා සැලසුම් සකස් කිරීම සඳහා **2015** සිට **2019** වර්ෂය දක්වා එකතුව රු. **48,678,878** ක් බලශක්ති අරමුදලේ අරමුණු වලට පටහැනි ලෙස ඒම අරමුදලේ ආයෝජන වලින් ඉවත් කරගෙන තිබුණි. | සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන ගොඩනැගිල්ල " Energy Plus" යන තේමාව යටතේ සැලසුම් කළ විදුලිය අරපිරිමැස්මෙන් ගොඩනැගිලි නිර්මාණය කළ හැකි බවට පෙන්වන ප්‍රදර්ශක ගොඩනැගිල්ලකි. "මෙම වියදම් සියල්ල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව සිදු කර ඇති බවද දන්වමි." | අධිකාරියේ පනත හා බලශක්ති අරමුදලේ අරමුණුවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II වන පරිච්ඡේදයේ **13.7** ඡේදය | මෙයින් බැහැරව වැඩබලන තනතුරු සඳහා **2013** වර්ෂයේ සිට **2019** වර්ෂය මැයි දක්වා වැඩ බැලීමේ දීමනා, ඉන්ධන දීමනා සහ ප්‍රවාහන දීමනා ලෙස එකතුව රු. **13,588,002**ක් ගෙවා තිබුණු අතර මෙම මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් නැවත අය කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පත්කිරීමේ බලධාරියා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා **22/09/2020** දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. මෙම ගැටළු විසඳීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් පත්කර ඇත. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි **454** | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව නව පරිගනක මෘදුකාංගය පවත්වා ගැනීමට කටයුතු සූදානම් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා ගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි **757(1)** | සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් භෞතික සත්‍යාපනය කර එම වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් භෞතික සත්‍යාපන කටයුතු නිමකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වත්කම් භෞතික සත්‍යාපනය කර වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි **395** (ඇ) | අධිකාරිය විසින් පවත්වාගෙනයනු ලබන බැංකු ජංගම ගිණුම් **05** ට අදාලව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර ඇති අතර මේ සමඟ ඔබගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන්නෙමු. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි **396** (ඇ) | වලංගු කාලසීමාව ඉක්මවූ රු. **1,260,442** ක චෙක්පත් සම්බන්ධයෙන් මෙම මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ගණුදෙනු කරුවන් වෙත ලිපි යැවීමට කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | භාණ්ඩාගාර චක්‍රලේඛ **1978** දෙසැම්බර් **19** දිනැති අංක **842** දරන චක්‍රලේඛය | එකතුව රු. **864,995,252** ක් වූ ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව පරිඝනක මෘදුකාංග ගතකොට විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යායුතුය. |
| (ඌ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ **2003** ජුනි **02** දිනැති අංක **12** දරන චක්‍රලේඛය | අතිකාල වියදම් පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (එ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **2011** දෙසැම්බර් **12** දිනැති අංක **28/2011** දරන චක්‍රලේඛය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට නොගැනෙන අධිකාරියේ ඉංජිනේරු තනතුර දරන නිලධාරීන් සඳහා **2016** අගෝස්තු මස සිට **2019** දෙසැම්බර් **31** දක්වා රු. **14,861,000**ක මුදලක් වෘත්තීය දීමනා ලෙස අධිකාරිය විසින් ගෙවා තිබුණි. | මේ සඳහා කැබිනට් අනුමැතියට යොමු කිරීමෙන් පසු **2019.10.29** දින අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ විමසා ඇත. | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අදාල දීමනාවක් බැවින් ගෙවීම් කිරීම නීත්‍යානුකූල නොවේ. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "ස්විච් -ඒෂියා" වැඩ සටහන යටතේ ඉතිරිව තිබූ රු. 4,548,176 ක් 2011 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමකද, බලශක්ති අරමුදලට අදාල රු. 150,000,000 කට වැඩි මුදලක් වසර ගණනාවක සිට ඉතිරි කිරීමේ ගිණුමක ද කිසිදු ඵලදායී ආයෝජනයක යොදවා ගැනීමෙන් තොරව තැන්පත් කර තිබුණි. | 'ස්විච්- ඒෂියා 'වැඩසටහන යටතේ වූ මුදල් සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර,එයඅමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | අදාල අනුමැතීන් යටතේ ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් පරිගණකගත ගිණුම්කරන පද්ධතියක් මගින් ගිණුම් තැබීම ආරම්භකර ඇතිමුත් ඊට අදාලව පොදු පාලනයන්(General Controls) ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | පරිඝනක ගිණුම්කරණ පද්ධතිය භාවිතා කිරීම ආරම්භ කිරීම 2019 වර්ෂයේදී සිදු වූ බැවින් පාලන ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම එම වර්ෂයේ දී අපහසු විය. | පොදු පාලන ක්‍රම හඳුන්වා දිය යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 43,440,808 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 116,219,249 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 72,778,441 ක අඩුවීමක් නිරීක්ෂණය විය. සූර්යබල ව්‍යාපෘති ලියාපදිංචි කිරීමෙන් ලද අදායම් රු.84,916,706 ක් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට 2012 වර්ෂයේදී RCL (Regional Centre for Lighting)මධ්‍යස්ථානයේ කළමනාකරණය සහ වත්කම් පවරාදීම නිසි පරිදි සිදුනොවීම හේතුවෙන් මෙම බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පදනමට (BMICH) අධිකාරිය විසින් ගෙවන ලද රු. 8,033,270 ක් වූ හිඟ බදු කුලී 2020 දෙසැම්බර් දක්වාම ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | RCL (Regional Center for Lightening) මධ්‍යස්ථානයේ හිඟ බදු මුදල ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වියදමක් ලෙස හඳුනා ගැනීමට අවසර ඉල්ලා ලිපියක් අමාත්‍යාංශයට හා භාණ්ඩාගාරයට යොමු කර ඇත. | ජාතික අයවැය දෙපාර්තමේන්තු වේ අදහස් විමසා සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) "ස්විච්-ඒෂියා" වැඩසටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7,334,354 ක මුදලින් රු. 3,135,202 ක්, චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව 2010 හා 2011 වර්ෂයන්හිදී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. | 'ස්විච්- ඒෂියා 'වැඩසටහන සඳහා වන මුල්‍ය ප්‍රතිපාදන සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර ,එය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | නීත්‍යානුකූල නොවන ගෙවීමක් බැවින් මෙය නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේ වාර්තාව අනුව 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා රු.2,171,760 ක් අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට හෝ නිවැරදි කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි. | අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සැකසීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත්කල කමිටුවට මෙහි එක් කර්තව්‍යයක් ලෙස ඉහත දෝෂ පිළිබඳව අධ්‍යනය කොට එය වාර්තාවට ඇතුලත් කරන ලෙස දැන්වූ අතර එම සම්පාදිත වාර්තාව සඳහා 2020.09.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන ලද කමිටුවේ වාර්තාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබාගැනීම. |
| (ඇ) 2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර පාර්ශවයකට රු. 7,956,800 ක් ගෙවා තිබුණි .කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 12ක් ගත වී තිබුණද, මෙය නිම කිරීම සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ අලාභය පියවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | අපක්ෂපාතී බේරුම්කරුවකු විසින් පැවැත්වූ සකච්ඡා අනුව මාදිලි ත්‍රිත්වයම ප්‍රදර්ශනය කල හැකි රථයක් නිර්මාණය කර දීමට අදාළ පාර්ශවය යෝජනා කොට ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලයෙහි අනුමැතියට යොමු කර ඇත. | නීත්‍යානුකූලව ගිවිසුම් මත කටයුතු කළ යුතු වේ. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොරියානු බලශක්ති නියෝජිත ආයතනය (KEA) හා අධිකාරිය විසින් ක්‍රියාත්මක නියමු ව්‍යාපෘතියක් යටතේ ප්‍රදානයක් ලෙස අධිකාරිය වෙත ලැබුණු සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ත්‍රී රෝද රථ 04 ක් ක්‍රියාකිරීමේ නියෝජිත ආයතනය ලෙස BMICH වෙත 2019 දෙසැම්බර් 13 දින භාරදී ඇති නමුත්, නියමු ව්‍යාපෘතියට අදාලව දත්ත එක්රැස් කරගැනීම සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණි. එසේම ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට ඵලදායිව භාවිතාවී නොමැති බවටද නිරීක්ෂණය විය. | 2020 වර්ෂය බලාපොරොත්තු වූ තරම් ප්‍රගතියක් අත්කරගැනීමට පවතින තත්වය මත නොහැකි විය. ඉංජිනේරුවන්ට පුහුණුවද ලබාදී අවශ්‍ය මගපෙන්වීම කර ඇත. | නියමු ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම සඳහා ගිවිසුම්ගතව ක්‍රියා කළ යුතුය. |

**3.3** අරමුදල් ඌන උපයෝජනය

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ප්‍රධාන ව්‍යාපෘති 04 ට අදාලව අයවැයගත වියදම රු. 207,400,000 ක් හා තත්‍ය වියදම රු. 131,129,145 ක් වූයෙන් මුළු ප්‍රතිපාදනයෙන් රු. 76,270,855 ක් එනම් සියයට 37 ක් ඉතිරි වී තිබුණු බව නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ අප්‍රේල් මස ඇති වූ පාස්කු ප්‍රහාරය හේතු කොට ගෙනද හා ජෛව ස්කන්ධ ව්‍යාපෘතිය සඳහා මුදල් වියදම් කල යුතු ක්‍රමවේදය (ශ්‍රී ලංකාවේ මූල්‍ය රෙගුලාසි ප්‍රකාරවද හෝ UNDP ආයතනයේ ක්‍රමවේදයන් අනුවද) ගැටලු සහගත තත්වයක් උද්ගතවීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ කරා ලඟාවීමට නොහැකි විය. | අයවැය කාලීනව සමාලෝචනය සිදුකල යුතු අතර වියදම් කාලපමාවකින් තොරව මූල්‍ය අංශය වෙත ලබාගැනීමේ විධිමත් ක්‍රමවේදයක් සකස්කිරීම. |
| (ආ)ඉඳුරාන ජාත්‍යන්තර ප්‍රවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂය සඳහා රු. 17,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ඉන් සියයට 55 ක් එනම් රු. 9,405,534 ක් ව්‍යාපෘතිය සඳහා අදාල කාලසීමාව තුල උපයෝජනය කර නැති බව නිරීක්ෂණය විය. | මෙම මුදල් වෙන්කරනු ලැබුවද අදාල වර්ෂය තුල එම මුදල් වියදම් කිරීමට නොහැකි වුවද ,මෙම ව්‍යාපෘතිය මේ වන විට නිම කර ඇත. | වාර්ෂිකව ඇස්තමේන්තු කල මුදල් අදාල ව්‍යාපෘති කාලසීමාව තුල නොපමාව උපයෝජනය කළ යුතුය. |

**3.4** ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

--------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරිය සහ මෙම අධිකාරිය අතර ඇතිකර ගත් 2015 ජුනි 22 දිනැති අංක 631 දරන බදු ගිවිසුම අනුව වසර 30 ක කාලයක බදු පදනම යටතේ අධිකාරිය සඳහා රු. 45,856,451 කට ලබා ගත් පර්චස් 75 ක ඉඩමෙහි 2019 වර්ෂය අවසානය දක්වා රු. 23,290,653 ක වියදමක් දරා සැලසුම් සකස් කිරීම පමණක් සිදුකර තිබුණ නමුත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රතිපත්තිය අනුව ඉදිකිරීම් ආරම්භ කිරීමට අපහසු තත්වයක් ඇතිවී ඇත. | ඉදිකිරීම් ආරම්භ කිරීම අධික ලෙස ප්‍රමාද වී ඇති බැවින් විකල්ප අරමුදල් සපයා ගැනීමේ මාර්ග සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත අනුමත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ මාස 06 ක පමණ ප්‍රමාදයකින් පසුව 2020 සැප්තැම්බර් 08 දිනය. | සේවක ඌණතාවය , ගිණුම්පොත් තුළ සටහන් කරන අතර තුර පරිසනක ගත ගිණුම් පද්ධතිය යන ක්‍රම දෙකටම පවත්වාගෙන යාමට සිදුවීම සහ රටේ උද්ගතවූ COVID 19 වසංගත තත්වය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වීම. | පවතින නීති විධිවිධාන ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි ආයතනය මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගෙන නොතිබුණි. | වසර 05ක කාලසීමාවක් සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර , අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුණි.ඉදිරි කාලසීමාව තුළ රටෙහි සුනිත්‍ය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය අයෝජන සම්බන්ධයෙන් ගැඹුරින් අවධානය යොමුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පෙන්වා දෙන ලද අතර ඒ අනුව උපදේශන සේවා ලබාගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතුය. |

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තාවක් සකස් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාවක් සකස්කරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කර වාර්තාවක් සකස්කර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |